# දේශගුණ විපර්යාස අවම කිරීම / ඇතිවන තත්ත්ව වලට මුහුණ දීම සඳහා ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ ගතහැකි පියවර කිහිපයක්


## නිමල් පෙරේරා

**ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරණ අධිකාරිය**


හැකි සෑම විටම විමසිලිමත් වන්න. ගෝලීය වශයෙන් සිදුවන දේශගුණ විපර්යාසවීම් ගැන සැළකිලිමත් වන්න. ගෝලීයව ඇතිවන විපර්යාසවලට අප සෘජුව හෝ තනි තනිව වගකිවයුතු නැති වුවත් මිනිස් ප්‍රජාවක් ලෙස අපද ඊට වගකිව යුතු බවත්, තමන් මිනිස් ප්‍රජාවේ සාමාජිකයෙකු ලෙස ඊට යහ ප්‍රතිචාර දැක්වීම අප අනාගත පරපුරට කරන යුතුකමක් ලෙස සිතන්න. එසේ සිතීම තුළින් පහත සුළු ක්‍රියාකාරකම්වලට එකිනෙකා, කණ්ඩායම් වශයෙන්, ප්‍රාදේශියව හා රටක් ලෙස දායක වීම තුළින් අපට බොහෝ දෑ සිදුකළ හැකි බවත්, තමන්ගේ හෘද සාක්ෂියට එකඟව සිදුකරනු ලබන යහ ක්‍රියාවන් මුළු රටේම මෙන්ම මුළු ලෝකයේ වුවද අභිවෘද්ධියට හේතුවන බව සිතට ගෙන කටයුතු කිරීම වඩාත් සුබවාදී වනු ඇත.

### 1. බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම

තමන්ගේ එදිනෙදා කාර්යයන් සඳහා බලශක්තිය යොදා ගැනීමේ දී උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව යොදා ගැනිමට කටයුතු කරන්න. බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම තුළ ආර්ථික ප්‍රතිලාභ මෙන්ම පාරිසරික ප්‍රතිලාභද ප්‍රත්‍යක්ෂ කළ හැක.

මේ සඳහා සරල උදාහරණ ලෙස උසස් බලශක්ති කාර්යක්ෂමතාවයකින් යුත් උපකරණ භාවිතා කිරීම, පවතින උපකරණවල බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම වැනි දේ සැලකිල්ලට ගත හැක.

### 2. හැකි සෑම විටම බලශක්ති භාවිතය අවම කරන්න

අනවශ්‍ය අවස්ථාවලදී බලශක්තිය හා බලශක්ති උපයෝගී උපකරණ භාවිතා කිරීම අවම කිරීම සිදුකළ හැක. උදාහරණයක් ලෙස අනවශ්‍යය විදුලි පහන් නිවා දැමීම, ඉන්ධන භාවිතා කරන වාහන භාවිතාව අවම කරමින් පොදු මහජන ප්‍රවාහන සේවා හෝ පාපැදි වැනි විකල්ප ක්‍රම භාවිතා කිරීම යනාදිය සැලකිල්ලට ගත හැක. අධික සූර්යයය රශ්මිය පවතින අවස්ථාවල තම රථයේ වායු සමීකරණ යන්ත්‍රය ක්‍රියාත්මකව පවත්වා ගනිමින් යම් ස්ථානයක රථය නවත්වාගෙන සිටීමට වඩා සෙවන සහිත ස්ථානයක රථ වාහනය නවත්වා තමන් පිටත රැදී සිටීම හෝ මෝටර් රථයේ වීදුරු නිරාවරණය කරගෙන සිටීමද හොඳ උදාහරණයකි.

### 3. විකල්ප බලශක්ති භාවිතාව

විවිධ අවශ්‍යතා සඳහා බලශක්ති භාවිතා කිරීමේදී පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිතාවට ගනිමින් මෙන්ම පොසිල ඉන්ධන දහනය කරමින් නිපැයෙන බලශක්ති

භාවිතාව අවම කිරීමට කටයුතු කළ හැක. උදාහරණයක් ලෙස සම්පීඩන පෙට්‍රෝලියම් වායු ඉන්ධන (LP GAS) වෙනුවට කාර්යයක්ෂම උඳුනක් යොදාගනිමින් දර භාවිතාව, විදුලි ආලෝකය වෙනුවට ස්වභාවික ආලෝකය යොදා ගැනීම, විදුලි පංකා වෙනුවට ස්වභාවික සුළං භාවිතාව යනාදිය සැලකිල්ලට ගත හැක.

### 4. හැකිතාක් දුරට සරල දිවිපෙවෙත් වලට පුරුදු වන්න

සරල දිවිපෙවෙතක් තුළ එදිනදා භාවිතා කරනු ලබන සම්පත් ප්‍රමාණයන් අවම වන නිසා ඔබගේ කාබන් පියසටහන් ඉතාම අඩු අගයට ගෙන ඒම සිදුවනු ඇත. උදාහරණ ලෙස අධික වර්ණවත් /කළු පැහැති ඇඳුම් පැලඳුම් වෙනුවට සුදු ඇඳුම් භාවිතා කිරීම, අධිසුඛෝපභෝගී භාණ්ඩ හා සේවාවන් වෙනුවට සරළ දේ භාවිතා කිරීම යනාදිය සැලකිල්ලට ගත හැක.

**5. හැකිතාක් දුරට ස්වභාවික ද්‍රව්‍ය පරිභෝජනයට නැඹුරු වන්න.**

ස්වභාවිකව පවතින ද්‍රව්‍ය විවිධ ක්‍රම උපයෝගි කර ගනිමින් වෙනත් ආකාරවලට / භාණ්ඩ හා සේවාවලට පරිවර්තනය කිරීමේදී අධික බලශක්තියක් වැය වනවා මෙන්ම එම ද්‍රව්‍යයේ හානි වන ප්‍රමාණයද වැඩි වේ. එසේ අධික බලශක්තියක් වැයවීම මෙන්ම ද්‍රව්‍යමය හානිය වැඩි වීම සෘජුවම වායුගෝලීය හරිතාගාර වායු ප්‍රමාණයන් ඉහළ නැංවීමටද දායක වේ. උදාහරණයක් ලෙස පිටි කිරි වෙනුවට දියර කිරි භාවිතාව වැඩි කිරීම මඟින් දියර කිරි, පිටි කිරි බවට පත් කිරිම සඳහා වැය වන තාප හා විදුලි බලශක්ති ප්‍රමාණයන් ඉතිරි කර ගැනීමට හේතු කාරක වේ. එමෙන්ම දේශියව නිපැයෙන දේවල් භාවිතාවට නැඹුරු වීම ජාත්‍යන්තර ප්‍රවාහන සේවා සඳහා යොදා ගනු ලබන ඉන්ධන භාවිතාව අඩු කිරීමටද හේතු කාරක වේ.

**6. දේශගුණ විපර්යාස පිළිබඳ තමන් සතු දැනුම අන් අයට බෙදා දෙන්න**

අවස්ථාවක් ලද හැම විටම මාධ්‍යය, තොරතුරු තාක්‍ෂණය හා වැඩමුළු යනාදියට සහභාගී වෙමින් ගෝලීයව හා දේශීයව දේශගුණ විපර්යාස පිළිබඳ දැනුම වැඩි වර්ධනය කර ගැනීමට කටයුතු කරන්න. එමෙන්ම තමන් ලබා ගත් දැනුම ඒ අයුරින්ම බෙදා ගනිමින් අන් අය දැනුවත් කිරීමට කටයුතු කරන්න.

**7. ඇති විය හැකි සම්පත් හිගවීම් වලදී හා විපත්වලදී සිදුවිය හැකි තත්ත්වයන්ට මුහුණ දීමට සුදානම් වන්න**

විශේෂයෙන්ම දේශගුණ විපර්යාස ආන්ත්‍රක තත්ත්වවලදී (ජල ගැලීම්, කුණාටු, නියඟ වැනි) ආහාර, ජලය, ඉන්ධන වැනි දේවල්, හිඟවීම්වලට මුහුණු දීමට සිදු විය හැකි බැවින් ඒ සඳහා ගත හැකි විකල්ප ක්‍රියා මාර්ග සඳහා සූදානම් වීම ඉතාමත් වැදගත්වේ. උදාහරණ ලෙස කලාපීයව සිදුවිය හැකි ආන්තික දේශගුණ විපර්යාස තත්ත්වවලදී මෙරටට ආනයනය කරනු ලබන භාණ්ඩ නොලැබී යාම නිසා සිදු විය හැකි භාණ්ඩ හිඟවීම්වලට සාර්ථකව මුහුණ දීම සඳහා දේශිය ආහාර ඇතුළු භාණ්ඩ නිෂ්පාදනයට යොමුවීම සැලකිල්ලට ගත හැක.

**8. තමන් සතු සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට පුරුදු වන්න.**

ඕදිනදා පිවිතයේ දී නාස්තිය අවම කිරීම ගැන අවධානය යොමු කිරීම හා ගත හැකි ක්‍රියා මාර්ග දිගින් දිගටම ගැනීම ඉතාම වැදගත් වේ.

මෙහිදී ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමයක් වන කොම්පෝස්ට් /කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතාවට ගැනීම වැනි දේ උදාහරණයකට ගත ශැක.

**9. හැකිතාක් දුරට ගස් සිටුවීමට / වන වගාවට මෙන්ම සිටුවන ලද ගස් සුරක්ෂිත කර රැකබලා ගැනිමට ද කැපවී කටයුතු කරන්න.**

ස්වාභාවික ශාකවලින් වායුගෝලයේ ඇති හරිතාගාර වායු අවශෝෂණය කර තැන්පත් කර තැබීමට දායක වන බැවින්ද මනා සිසිලක් ගෙන දීමට කටයුතු කරන බැවින්ද ගස් වගා කිරීම මෙන්ම රැකබලා ගැනිමද ඉතා වැදගත් වේ.

**10. අපද්‍රව්‍ය ජනනය කිරීම අවම කිරීමට කටයුතු කරන්නාක් මෙන්ම ඇතිවන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා දායක වන්න.**

සංවර්ධන ක්‍රියාවලිය තුළ විශේෂයෙන්ම දිරාපත් නොවන අපද්‍රව්‍ය එක්රැස් වීම අද මහත් සමාජයටම ප්‍රශ්නයක් බවට පත්ව ඇත. එබැවින් ඒවා නිසි පරිදි එක්රැස් කර ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීම බොහෝ විට සෘජුවම හෝ වක්‍රකාරව දේශගුණ විපර්යාස අවම කිරීමට දායක වේ. උදාහරණ ලෙසට ප්ලාස්ටික් ලෝහ වර්ග හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමුවීම හොඳ නිදසුනකි.